පලාත් අධ්‍යාපන දෙපාර්තමෙන්තුව - සබරගමුව

සතිය -

ශ්‍රේණිය - 6

විෂය - චිත්‍ර විෂය

සැකසුම - උපුලී චතුරානි ධර්මසේන

මාවනැල්ල අධ්‍යාපන කලාපය

## 6.1.2 තෛපෝංගල් උත්සවය

### තෛපෝංගල් උත්සවය ආශ්‍රිත චිත්‍රමය අංග හඳුනාගනිමු.



තෛපොංගල් උත්සවයේදී කිරි ඉතිරවීම





කෝලම් රටාවක්

- **හින්දු භක්තිකයන්ගේ ප්‍රධාන ආගමික උත්සවයකි.**
- දමිල අවුරුදු ක්‍රමය අනුව වසරේ පළමු මාසය වන ජනවාරි මාසය සඳහා "තෛ" යන නාමය හඳුන්වන අතර අලුත් සහල් අලුත් මැටි මුට්ටියක දමා පිළියෙළ කර කිරි ඉතිරීම "පොංගල්" යනුවෙන් හැඳින්වේ.
  **ජනවාරි මාසයේ අලුත් සහල් වලින් කිරි ඉතිරවීම තෛපෝංගල් උත්සවය ලෙස හඳුන්වයි.**
- **ලංකාවේ උතුරු සහ උතුරු නැගෙනහිර ප්‍රදේශ වලත් වැඩිපුරම හින්දු භක්තිකයින් සිටින අසල්වැසි ඉන්දියවේත් බොහෝ ප්‍රදේශ වල් මෙම උත්සවය පවත්වයි.**

**<u>හින්දු භක්තිකයින් උත්සවය සඳහා සූදානම් වන ආකාරය සහ කෙරෙන ආකාරය</u>**

- උත්සවය පැවැත්වීමට පෙර නිවාස හා ගෙබිම පිරිසිදු කරයි.
- දොරටුව දෙපස කෙසෙල් ගස් වලින් තොරණක් සාදයි.
- පිරිසිදු කරගත් ගෙබිම මැද කහ කුඩු සහ පාන් පිටි වලින් කෝලම් රටා නිර්මාණය කරයි.
- කෝලම් රටාවේ මැද ලිපක් බැඳ කිරි බත් පිසි ගනීයි.
- එමෙන්, කෝලම් රටාවේ මැද පූර්ණ කුම්භය ( පුන්කලසක්) තබා පහනක් දල්වා කිරිබත් පිළියෙළ කර හිරු උදාවත් සමඟ කිරි, උක් හකුරු, පලතුරු සහ වී තබා හිරු දෙවියන්ට පූජා කරනු ලැබේ. මෙම කාර්යය දින 04 ක් පුරා සිදු කරනු ලැබේ.

- උත්සව සමයේදී සුබ පැතුම්පත් හුව මාරුව, තෑගි බෝග හුවමරු කිරිම හා නිවසේදී මෙන්ම කෝවිලට ගොස් යාතිකා කිරීම මඟින් සතුට, සමාජ බැඳීම් අලුත්වීම, එකමුතුක හා සහයෝගීතාව වැනි ගුණාංග වර්ධනය වේ.

**<u>ඇගයීම</u>**

1. තෛපොංගල් උත්සවය කවර ආගමිකයින් විසින් පවත්වනු ලබන්නේ ද?

2. තෛපොංගල් උත්සවය විචිත්‍රවත් කරන නිර්මාණ අංග්ග මොනවා ද?

3. "තෛ" හා "  පොංගල් යන වචන වල අර්ථය ලියන්න.

4. කෝලම් රටාවක් නිර්මාණය කරන්න.

5. මේ කාලයේදී හින්දු භක්තිකයෝ තුළ වර්ධනය වන ගුණංග මොනවා ද?